සැ. යු. — 2014.03.14 දින පළ වූ අංක 1,854 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,855 - 2014 මාර්තු මස 21 වැනි සිකුරාදා - 2014.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 448 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 451 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 459 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අප්‍රේල් මස 11 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මාර්තු මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

"*යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.*"

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

**තලවාකැලේ ලිඳුල නගර සභාව**

(මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම)

තලවාකැලේ ලිඳුල නගර සභාවේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරුවලට ස්ථිර පදනම මත බඳවාගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති මධ්‍යම පළාත තුළ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | පීඑල්2-2006ඒ රු.12,210-10x130-10x145-10x160-12x170-රු.18,600 | 1. *අධ්‍යාපන සුදුසුකම් :-* දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම.<br>2. *ශිල්පීය නිපුණතා /ප්‍රවීණතා අදාල තනතුරේ පළපුරුද්දක් ලබා තිබීම.* |
| 02. | ආදාහනාගාර සහයක | *01* | පීඑල්1-2006ඒ රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 | . *අධ්‍යාපන සුදුසුකම් :-*<br>1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. |
| 03. | සෞඛ්‍ය කම්කරු iii | *01* | පීඑල්1-2006ඒ රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 | . *අධ්‍යාපන සුදුසුකම් :-*<br>1. අට(8) වන ශ්‍රේණියට (නව 09 වන වසරට) නියමිත විෂය නිර්දේශය සම්පූර්ණ කර තිබීම. |

04.1 ඉහත තනතුරු සඳහා වන පොදු සුදුසුකම් :

1. ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.
2. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.
3. තලවාකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
4. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තෙකු විය යුතු ය.

04.2 බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-

(1) අයදුම්කරු/කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකිකයන් විය යුතු ය.
(2) අයදුම්කරු/කාරිය තලවාකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය.
(3) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(4) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතු ය.
(5) රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබුවෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙක් නොවිය යුතු ය.
(6) තලවාකැලේ ලිඳුල නගර සභා කාර්යාලයේ දැනට ආදේශක පදනම මත සේවය කරන සේවකයින්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
(7) අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

04.3 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-

(1) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.
(2) වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
(3) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.

(4) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද, මධ්‍යම පළාතේ පළාත් සභාවේ/මධ්‍යම පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා තලවාකැලේ ලිඳුල නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

05. ඉල්ලුම් කළ යුතු ආකාරය ;-

1. මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ ආකෘතිය පරිදි (12 x 8 ප්‍රමාණයේ) අයදුම්පත් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2014 අප්‍රේල් 07 වැනි දිනට පෙර ලේකම්, තලවාකැලේ ලිඳුල නගර සභාව, තලවාකැලේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය.) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු වන අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය:-

   (1) උප්පැන්න සහතිකය ;
   (2) අධ්‍යාපන සහතික ;
   (3) තම පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය ;
   (4) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරියාගෙන් ලබාගත් එකක් විය යුතුයි.) ;
   (5) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික (රජයේ/පළාත් පාලන).

3. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

4. *බඳවා ගැනීමේ ක්‍රමය :*

   (1) අයදුම්කරුවන් අතරින් නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර පුරප්පාඩු පිරවීම සිදුකරනු ලැබේ.

   (2) මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුර හෝ බඳවාගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීමේ සියලු බලතල නගර සභාවේ ලේකම් සතුවේ.

එච්. එම්. පී. අජිත් පුෂ්පකුමාර,<br>ලේකම්,<br>තලවාකැලේ ලිඳුල නගර සභාව.

2014 මාර්තු මස 04 වැනි දින,<br>තලවාකැලේ ලිඳුල නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**තලවාකැලේ ලිඳුල නගර සභාව**

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ .................. තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. (i) මුලකුරු නමග නම :——————————.

   (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.

2. (i) ස්ථිර ලිපිනය:——————————.

   (ii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.

3. (i) උපන් දිනය:——————————.

   (ii) 2014.04.07 දිනට වයස:——————————.

4. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.

5. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.

6. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද ?:——————————.

   පුරවැසිභාවය (පරම්පරාවෙන් ද? නැතහොත් ලියාපදිංචියෙන් ද ? යන්න සඳහන් කරන්න):——————————.

7. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර):——————————.

(i) සමත් වූ වසර/ශ්‍රේණිය:——————————.

(ii) අ.පො.ස. (සා.පෙළ) /(උ.පෙළ) විභාගය ៖

*අ.පො.ස. (සා.පෙළ)*

*විභාග අංකය* :——————————.
*වර්ෂය හා මාසය*:——————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

*අ.පො.ස. (උ.පෙළ)*

*විභාග අංකය* :——————————.
*වර්ෂය හා මාසය*:——————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

8. ඔබ දැනට නගර සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර :——————————.

9. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————.

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?:——————————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි.
මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරාගැනීමෙන් පසුව දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය -

ඉල්ලුම්කරු වන .................................................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ /ආයතනයේ ............................................................ වශයෙන් සේවය කරයි. ඔහු / ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැතිබව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:——————————.

පදවි නාමය:——————————.

දෙපාර්තමේන්තුව/ආයතනය:——————————.
(නිල මුද්‍රාව යොදන්න)

දිනය:——————————.

03-587

# පළාත් පාලන නිවේදන

## මුලටියන ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය සභාව විසින් 2014 පෙබරවාරි මස 20 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් මාර්ග මුලටියන ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස ප්‍රකාශයට පත් කිරීමට සුදුසු බවට තීරණය කරන ලදී.

මේ පිළිබඳව මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ එම මාර්ගයන්ට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 24(2) වැනි වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනිල් ඇල්ලදෙනිය,
සභාපති,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2014 පෙබරවාරි මස 20 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය අංක 01

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | දෙමටගස්දෙණිය මාර්ගය |
| මාර්ගය ආරම්භ වන ස්ථානය | :- | පණ්ඩිතපෝරුව හන්දිය |
| මාර්ගය අවසන් වන ස්ථානය | :- | දෙයියන්දර කිරම පාර |
| මාර්ගයේ දිග | :- | මීටර 1,553 |
| මාර්ගයේ පළල | :- | අඩි 18 |
| මාර්ගය අයත් වන ග්‍රාම නිලධාරි වසම | :- | පරපාමුල්ල බටහිර |

| *වම්පස පිහිටි ඉඩම්* | *දකුණු පස පිහිටි ඉඩම්* |
|---|---|
| හිත්තැටිය කුඹුර | නාරංගහ ඇල යාය |
| හැල්පොත කුඹුර | දෙමටගස්දෙණිය සිට ඇල |
| මැද කුඹුර | මුත්තයි දෙණිය ළිඳ |
| උඩහ දෙමටගස්දෙණිය | පල්ලදෙනිය ඉඩම |
| බිරිගවත්ත කුඹුර | නොම්මර 02 කැබැල්ල |
| උඩහ දෙමටගස්දෙනිය | |
| මුත්තහි දෙණිය කුඹුර | |
| කුඩගල් කැටිය ඉඩම | |

### උපලේඛනය අංක 02

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | උදාගමේ පිට්ටනියේ සිට අම්බලහේන කන්ද දක්වා මාර්ගය |
| මාර්ගය ආරම්භ වන ස්ථානය | :- | උදාගමේ පිට්ටනිය |
| මාර්ගය අවසන් වන ස්ථානය | :- | අම්බලහේන කන්ද |
| මාර්ගයේ දිග | :- | මීටර 388 |
| මාර්ගයේ පළල | :- | අඩි 18 |
| මාර්ගය අයත් වන ග්‍රාම නිලධාරි වසම | :- | බමුණුගම බටහිර |

| *වම්පස පිහිටි ඉඩම්* | *දකුණු පස පිහිටි ඉඩම්* |
|---|---|
| කිරිවැල | කිරිවැල |

### උපලේඛනය අංක 03

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | පැලවත්ත කොරටුව මාර්ගය |
| මාර්ගය ආරම්භ වන ස්ථානය | :- | කිරම හඳුගල මාර්ගය |
| මාර්ගය අවසන් වන ස්ථානය | :- | දෙයියන්දර කිරම පාර |
| මාර්ගයේ දිග | :- | මීටර 250 |
| මාර්ගයේ පළල | :- | අඩි 18 |
| මාර්ගය අයත් වන ග්‍රාම නිලධාරි වසම | :- | 273, කැටියපේ උතුර |

| *වම්පස පිහිටි ඉඩම්* | *දකුණු පස පිහිටි ඉඩම්* |
|---|---|
| කෝවිලේ වත්ත | අරඹෙකොරටුව |
| පැලවත්ත කොරටුව | අළුත් ගෙදර කොරටුව |
| | පැලවත්ත |

**උපලේඛනය අංක 04**

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | ජය මාවත |
| මාර්ගය ආරම්භ වන ස්ථානය | :- | පාවුල ගෙදර අසල |
| මාර්ගය අවසන් වන ස්ථානය | :- | පහල බදුවත්ත |
| මාර්ගයේ දිග | :- | මීටර 300 |
| මාර්ගයේ පළල | :- | අඩි 18 |
| මාර්ගය අයත් වන ග්‍රාම නිලධාරී වසම | :- | 273, කැටියපේ දකුණ |

| *වම්පස පිහිටි ඉඩම්* | *දකුණු පස පිහිටි ඉඩම්* |
|---|---|
| දිවුල්ගහවත්ත ඉඩම | පාවුල ගෙදර වත්ත ඉඩම |
| පාලුවත්ත කැල්ල ඉඩම | පේරගහවත්ත ඉඩම |

**උපලේඛනය අංක 05**

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | අබේවික්‍රම මාවත මාර්ගය |
| මාර්ගය ආරම්භ වන ස්ථානය | :- | නවතගාව සිට |
| මාර්ගය අවසන් වන ස්ථානය | :- | අන්නාසිහේන හරස් මාර්ගය දක්වා |
| මාර්ගයේ දිග | :- | මීටර 750 |
| මාර්ගයේ පළල | :- | අඩි 18 |
| මාර්ගය අයත් වන ග්‍රාම නිලධාරී වසම | :- | රත්සැගොඩ උතුර |

| *වම්පස පිහිටි ඉඩම්* | *දකුණු පස පිහිටි ඉඩම්* |
|---|---|
| දිසාගවිල කුඹුර | රජ උයන |
| 56 එල් 16 ඉඩම | දිසාගවිල කුඹුර |
| 56 එල් 23 ඉඩම | 56 එල් 24 ඉඩම |
| 56 එල් 26 ඉඩම | 56 එල් 25 ඉඩම |
| 56 එල් 29 ඉඩම | 56 එල් 28 ඉඩම |
| රිසිවේසම් | රිසිවේසම් |

**උපලේඛනය අංක 06**

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | ඩී 12 නවත මාර්ගය |
| මාර්ගය ආරම්භ වන ස්ථානය | :- | සේනානායක ගොඩ මාර්ගය |
| මාර්ගය අවසන් වන ස්ථානය | :- | ඩී කැබැල්ල |
| මාර්ගයේ දිග | :- | මීටර 270 |
| මාර්ගයේ පළල | :- | අඩි 18 |
| මාර්ගය අයත් වන ග්‍රාම නිලධාරී වසම | :- | දෙයියන්දර |

| *වම්පස පිහිටි ඉඩම්* | *දකුණු පස පිහිටි ඉඩම්* |
|---|---|
| ඩී අක්ෂරයෙන් ඉවත් වූ කොට | ඩී 10 කැබැල්ල |
| ඩී 7 කැබැල්ල | ඩී 3 කැබැල්ල |
| ඩී 6 කැබැල්ල | ඩී 2 කැබැල්ල |
| ඩී 4 කැබැල්ල | ඩී 2 කැබැල්ල |
| ඩී 2 කැබැල්ල | ඩී 2 කැබැල්ල |

**උපලේඛනය අංක 07**

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | ඩී12 අතුරු මාර්ගය |
| මාර්ගය ආරම්භ වන ස්ථානය | :- | ඩී 12 නවත මාර්ගය |
| මාර්ගය අවසන් වන ස්ථානය | :- | ඩී1 කැබැල්ල |
| මාර්ගයේ දිග | :- | මීටර 130 |
| මාර්ගයේ පළල | :- | අඩි 18 |
| මාර්ගය අයත් වන ග්‍රාම නිලධාරී වසම | :- | දෙයියන්දර |

| *වම්පස පිහිටි ඉඩම්* | *දකුණු පස පිහිටි ඉඩම්* |
|---|---|
| සී අක්ෂර කැබැලි | ඩී7 කැබැල්ල |
| සී අක්ෂර කැබැලි | ඩී5 කැබැල්ල |
| සී අක්ෂර කැබැලි | ඩී3 කැබැල්ල |
| සී අක්ෂර කැබලි | ඩී 1 කැබැල්ල |

03-494

### කල්මුනේ මහ නගර සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 02 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරිය වන 1947 අංක 29 දරන මහ නගර සභා ආඥා පනතේ 71(1) වැනි වගන්තිය යටතේ නැගෙනහිර පළාතේ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර වෛද්‍ය රිස්වි වීදිය යනුවෙන් නැවත නම් කරනු ලැබ ඇති මෙයින් නිවේදය කරනු ලැබේ.

ජේ. ලියාකත් අලී මහතා,
නාගරික කොමසාරිස්,
කල්මුණ මහ නගර සභාව.

මහා නගර සභාව,
පොලිස් ස්ථානය පාර,
කල්මුණ.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | - | කල්මුණ මහ නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | - | අම්පාර |
| 03. | වීථියේ වර්තමාන නම | - | පිච්චිපිලාවඩි වීදිය |
| 04. | අලුතින් යොදා ඇති නම | - | වෛද්‍ය රිස්වි වීදිය |
| 05. | මාර්ග විස්තරය | - | මෙම වීදිය කල්මුණ මහ නගර සභාවට අයත්, කල්මුණ-අක්කරපත්තු ප්‍රධාන වීදියෙන් (A-4) ආරම්භ කර නැගෙනහිර මුහුදු වෙරළ පාරෙන් අවසන් වේ. |

03-522

---

### මාතර මහ නගර සභාව

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම.

මාතර මහ නගර සභාවේ සභා සම්මුතියට අනුව, වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

මහ නගර සභා ආඥා පනතේ 252 අධිකාරය ප්‍රකාර 71(1) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි, වර්තමාන නමින් ඇති මාවත අලුතින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,

2014 ජනවාරි මස 17 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *පළාත් පාලන ආයතනයේ නම* | *දිස්ත්‍රික්කය* | *වීථියේ වර්තමාන නම* | *අලුතින් යොදා ඇති නම* | *මාර්ග විස්තරය* |
|---|---|---|---|---|
| 01. මාතර මහ නගර සභාව | මාතර | මොහොට්ටිලේන් | එච්. ඩබ්ලිව්. රූපසිංහ මාවත | මාතර අනගාරික ධර්මපාල මාවතේ සිට හක්මන පාර හා සම්බන්ධවන අතුරු පාර |

03-401

---

### මාතර මහ නගර සභාව

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම

මාතර මහ නගර සභාවේ සභා සම්මුතියට අනුව, වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

මහ නගර සභා ආඥා පනතේ 252 අධිකාරය ප්‍රකාර 71(1) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි, වර්තමාන නමින් ඇති මාවත අලුතින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,

2014 ජනවාරි මස 31 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| පළාත් පාලන ආයතනයේ නම | දිස්ත්‍රික්කය | වීථියේ වර්තමාන නම | අලුතින් යොදා ඇති නම | මාර්ග විස්තරය |
|---|---|---|---|---|
| 01. මාතර මහා නගර සභාව | මාතර | ඇලවේල්ල පාර | ගුරුවෙල උපරතන නාහිමි මාවත | මාතර රාහුල පාර විදුලි බල මන්ඩලය අසල සිට කුමාරදාස මාවත හා සරම්මුදලි මාවත සම්බන්ධ වන පාලම දක්වා |

03-496

---

**හබරාදූව ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් හබරාදූව ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාල ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් හෝ යම් විරුද්ධතාවයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දිනයේ සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මාර්ග හබරාදූව ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිල්ෂාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2014 පෙබරවාරි මස 24 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| පාරේ නම | :- | කටුකුරුන්ද දෙණියවත්ත පාර |
| ආරම්භය | :- | දික්කුඹුර පාර |
| අවසානය | :- | දෙණියවත්ත පාර |
| පාරේ දිග | :- | මීටර 110 |
| පාරේ පළල | :- | අඩි 10 |
| ග්‍රාමසේවා වසම | :- | කටුකුරුන්ද |

*වම්පස පිහිටි ඉඩම්*

පී. ජී. ලක්ෂ්මන් - කටුකුරුන්ද
පී. එම්. ජේ. ජයසිංහ - කටුකුරුන්ද
පී. ජේ. විජේසිංහ - කටුකුරුන්ද
පී. එම්. සී. ගංගානි - කටුකුරුන්ද
කේ. ජී. ඒ. එස්. මහින්ද - කටුකුරුන්ද
ඉන්ද්‍රා ශාන්ති මානවඩු - කටුකුරුන්ද
එම්. එල් රත්නසිරි - කොක්වත්ත

03-585

---

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත (272) වැනි අධිකාරය

අවිස්සාවේල්ල ගුරුගල්ල අංක 579 හි පදිංචි ඩී. සුරේෂ් තාරක ඩයස් නැමැති අය විසින් අවිස්සාවේල්ල නාපාවල පල්ලිය පාරේ අංක 198C හි පදිංචි එම්. එම්. එම්. නියාස් නැමති අයට අයත් සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අටුළුගම කෝරළේ නාපාවල ගමේ පිහිටි රත්නමල්ලන්ගේසින්නගේවත්ත නමැති ඉඩමේ 2014.12.31 දින දක්වා ගෝඝාතකාගාරයක් ඉදිකිරීමට අවසර ඉල්ලා ඇත.

මේ සම්බන්ධයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් ඔහු/ඇය විරුද්ධ වීමට හේතුවූ කරුණු පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීමේ සඳහන් දින සිට දින 14ක් ඇතුළත ලේඛනගත තැපෑලෙන් මා වෙත දැන්විය යුතු බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7(2) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ඒ. අයි. අමිල රුවන් කන්දෙආරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඕවිට.

2014 පෙබරවාරි මස 26 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ දී ය.

03-584

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2013.09.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩී. එම්. උපාලි දිසානායක,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

### උපලේඛනය

01. පාරේ නම : නාගොල්ල පුවක්දෙණිය ගම් සහා මාර්ගයට සම්බන්ධ වන ගුණසේකර මාවත
වසම : පුවක්දෙණිය
දිග : අඩි 957
පළල : අඩි 10


*පාරේ වම් පස*

| | | |
|---|---|---|
| 1. | එම්. ඩබ්. ආනන්ද සිරිපාල | වැරුල්ලහේන වත්ත හපුගහමුල වත්ත |
| 2. | බී. එම්. ඩී. ප්‍රේමරත්න | |
| 3. | ජී. ආර්. රත්නායක | |
| 4. | එච්. ඩබ්. වී. ප්‍රියන්ත මහීලාල් | |
| 5. | එස්. ඒ. ටී. කුමාරි | |
| 6. | එච්. ජේ. ආර්. හිටිහාමු | |
| 7. | පී. ඩබ්. නන්දාවති මැණිකේ | වැරුල්හේන වත්ත |
| 8. | ඒ. දයානන්ද රාජා | |
| 9. | ඩබ්. ඩබ්. ජයතිලක බණ්ඩාර | |
| 10. | ආර්. ඒ. නිහාල් රණසිංහ | |
| 11. | එල්. ආර්. චමින්ද සම්පත් ගුණසේකර | |
| 12. | එල්. ආර්. ගුණසේකර | |
| 13. | එල්. ආර්. නුවන් බද්ධික ගුණසේකර | |
| 14. | බී. ඒ. රංමැණිකේ | බෝගහමුලහේන |
| 15. | ඒ. ඒ. මල්ලිකා කුමාරි අතාවුද | |

*පාරේ දකුණු පස*

1. එච්. දයානන්ද - වැරුල්ලේහේන වත්ත
2. එස්. එන්. රාජකරුණා - වැරුල්ලේහේන
3. කේ. කේ රත්නායක - වැරුල්ලේහේන
4. එල්. ආර්. ගුණසේකර - වැරුල්ලේහේන වත්ත

01. නාගොල්ල පුවක්දෙණිය ගම් සහා මාර්ගයට සම්බන්ධ වන ගුණසේකර මාවත




02. පාරේ නම : මීදෙණිය දකුණ වසම විහාර මාවත සිට වතුරවත්ත සහ අඹතැන්න වත්තට යන මාර්ගය නිවැල්ල සිට අඹතැන්න දක්වා පාර
වසම : මී දෙණිය දකුණු වසම
දිග : මීටර් 180
පළල : මීටර් 2.5

| *පාරේ වම් පස* | *පාරේ දකුණු පස* |
|---|---|
| ඩබ්. යූ. දර්ශන බණ්ඩාර වතුරේ වත්ත | 1. එස්. ඒ. ජයතිලක බණ්ඩාර - වතුරේ වත්ත |
| | 2. එස්. ඒ. විමලාවතී - වතුරේ වත්ත |
| | 3. එස්. ඒ. කරුණාතිලක - වතුරේ වත්ත |
| | 4. කේ. ඒ. යසරත්න - ලමිදුගේ හේන |
| | 5. එම්. හීනටිගල - අඹතැන්න හේන |
| | 6. වී. ආර්. සුරංජිත් ප්‍රේමබන්දු - අඹතැන්න හේන |
| | 7. ගාමිණී පද්මරාජ් බණ්ඩාර - අඹතැන්න හේන |
| | 8. කේ. ඒ. කීර්ති අබේනායක - අඹතැන්න හේන |

02. මීදෙණිය දකුණු වසමේ විහාර මාවත සිට වතුරවත්ත සහ අඹතැන්න වත්තට යන මාර්ගය නිවැල්ල සිට අඹතැන්න දක්වා පාර

*P.P.C. Jayasena*
*Licensed Surveyor , Leveller*
*Court Commissioner*
*Higgoda*
*Undugoda*
*Telephone No: 035-2278728*

*Plan No :1033*




*Scale ; 1:1000*

## *PLAN*

*Shown Niwella- Ambathenna Road , (From Meedeniya - Wathura Road To Ambathennahena)*
*situated at Meedeniya Village , in Mawatha Pattu of*
*Paranakuru Korale Kegalle District*
*Sabaragamuwa Province*

*bounded as described above*

*Date of Survey :- 2012.02.12*


**P.P.C. Jayasena**
**Registered Licensed Surveyor Leveller & Court Commissioner**

*Licensd Surveyor*
*2012. 02. 22*

03. පාරේ නම :කුරුඹාපිටිය බෝගහමුල පාර
වසම : බෝගල
දිග : මීටර් 171
පළල : මීටර් 2.5

| පාරේ වම් පස | පාරේ දකුණු පස |
|---|---|
| 1. එම්. කේ. සුනිල් විජයරත්න - ජයසිංහගේ වත්ත | 1. පුංචිරාල - ජයසිංහගේ වත්ත |
| 2. එම්. කේ. කුමාර - ජයසිංහගේ වත්ත | 2. වී. අල්ලිසා - ගලඋඩහේන දැනට වත්ත |

03. කුරුඹාපිටිය බෝගහමුල පාර




සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ
පරණකුරු කෝරළේ කඳුපහ පත්තුවේ කුරුම්බාපිටිය ගමේ පිහිටි
පහත්නැගේගේ වත්ත
නැමති ඉඩම මැන සාදන ලද කැබලි 18 ක
පිඹුර

| කැබලි අංකය | ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | ප |
| 1 | 0.02087 | 0 | 0 | 08.25 |
| 2 | 0.06025 | 0 | 0 | 23.82 |
| 3 | 0.01850 | 0 | 0 | 07.31 |
| 4 | 0.18550 | 0 | 1 | 33.34 |
| 5 | 0.05950 | 0 | 0 | 23.52 |
| 6 | 0.00820 | 0 | 0 | 03.24 |
| 7 | 0.01940 | 0 | 0 | 07.67 |
| 8 | 0.00475 | 0 | 0 | 01.88 |
| 9 | 0.05250 | 0 | 0 | 20.76 |
| 10 | 0.02570 | 0 | 0 | 10.16 |
| 11 | 0.05450 | 0 | 0 | 21.55 |
| 12 | 0.06125 | 0 | 0 | 24.22 |
| 13 | 0.07620 | 0 | 0 | 30.13 |
| 14 | 0.02050 | 0 | 0 | 08.10 |
| 15 | 0.08950 | 0 | 0 | 35.38 |
| 16 | 0.03075 | 0 | 0 | 12.16 |
| 17 | 0.02900 | 0 | 0 | 11.47 |
| 18 | 0.00675 | 0 | 0 | 02.67 |
| එකතුව | 0.82362 | 2 | 0 | 05.68 |

මනින ලද දිනය : 2007-07-01

04. අඹවල සමගි මාවත
වසම: උඩුවාගම
දිග : මීටර් 500
පළල : මීටර් 2.5


පාරේ වම් පස

1. බී. වී. ආර්. බෝගල - හිටිනාවත්ත
2. ආර්. ඒ. මාලිනී රණබාහු - හිටිනාවත්ත
3. ඒ. පියුමි මංජුලා සෙනෙවිරත්න - හිටිනාවත්ත
4. එච්. ආර්. පොඩිමැණිකේ - හිටිනාවත්ත
5. එස්. ආර්. ආරියපාල - හිටිනාවත්ත
6. ජී. ආර්. විමලදාස - හිටිනාවත්ත
7. ඒ. සුබරත්න බණ්ඩා - හිටිනාවත්ත

පාරේ දකුණු පස

1. ඒ. අශෝකා ප්‍රියන්ති ලාල් - හිටිනාවත්ත
2. ජී. ආර්. සුරේෂ් නිශාන්ත ගමගේ - හිටිනාවත්ත

04. අඹවල සමගි මාවත




පරිමාණය:- අඟලට දම්වැල් 2 යි

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරලේ මාවත පත්තුවේ අඹවල ගමේ හිටිනාවත්ත නමැති ඉඩමේ

පිඹුර

මායිම්:

උතුරට :-
නැගෙනහිරට :-
දකුණට :-
බස්නාහිරට :-
ඉහත සඳහන් පරිදි-

බිම් ප්‍රමාණය:-

| කැබලි අංකය | අ. | රූ. | ප. | හෙක්ටාර් | කොටස | විස්තරය පැමිණි අය |
|---|---|---|---|---|---|---|
| 1. | 0. | 1. | 06.3 | 0.1184 | | ඒ. කිංගිරිමහත්තයා |
| 2. | 0. | 2. | 12.6 | 0.2367 | | ජී. පිංචිඅප්පුහාමි |
| 3. | 0. | 0. | 02.4 | 0.0061 | | ප්‍රවේශ මාර්ගය පොදුවේ. |
| 4. | 0. | 1. | 02.6 | 0.1077 | | එස්. ආර්. පියසේන |
| 5. | 0. | 1. | 02.6 | 0.1077 | | ජී. ආර්. විමලදාස. |
| 6. | 0. | 0. | 01.4 | 0.0035 | | ප්‍රවේශ මාර්ගය පොදුවේ. |
| 7. | 0. | 2. | 05.2 | 0.2155 | | ඒ. සුබරත් බණ්ඩා |
| 8 | 0. | 0. | 16.0 | 0.0405 | | ප්‍රවේශ මාර්ගය පොදුවේ |
| එකතුව | 2 | 0 | 09.1 | 0.8364 | | |

මැනීම කළ දිනය:- 1995. 06. 21
බෙදීම කළ දිනය:- 1995. 07. 27.

බලයලත් මිනින්දෝරු
1996. 04. 22.

### රිදීගම ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත**

261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීමේ පොදු ස්ථාන ඇති කිරීම හා එම ස්ථානවල වාහන නවතා තැබීම, විධිමත් කිරීම හා පාලනය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා 2010.07.16 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) කොටස මගින් අතුරු ව්‍යවස්ථාවක් ප්‍රකාශයට පත් කර ඇත. එම අතුරු ව්‍යවස්ථාව 2011.11.18 වැනි දින රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරමින් රිදීගම ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇත.

ඒ අනුව, රිදීගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති ත්‍රිරෝද රථ නවතා තැබීමේ පොදු ස්ථාන පහත සඳහන් උපලේඛනයේ පරිදි 2012.05.03 මහ සභාවේ තීරණ අංක 4(02) යටතේ යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. ඩී. ඩී. එන්. කේ. පල්ලමුල්ල,
සභාපති,
රිදීගම ප්‍රාදේශීය සභාව.

2013 අගෝස්තු මස 01 වැනි දින,
රිදීගම දී ය.

*මාදුරේ කෝරලය*

1. කව්සිගමුව හන්දිය, මොරතිහ
2. හුණුගල්කඩුල්ල හන්දිය, මොරතිහ
3. වරකාවැහැර හන්දිය
4. රඹුකන්දන මුස්ලිම් පල්ලිය අසළ
5. මාතලේ හන්දිය, රිදීගම
6. රෝහල ඉදිරිපිට, රිදීගම
7. රිදීගම වත්ත ඉදිරිපිට, රිදීගම
8. දේවාල හන්දිය, රිදීගම
9. කටුපිලගොල්ල හන්දිය
10. මඩිතියාව හන්දිය
11. ඔලගම හන්දිය
12. රම්බඩගල්ල උසාවිය අසළ
13. රම්බඩගල්ල සමූපකාරය අසළ
14. රම්බඩගල්ල නිවාස යෝජනා ක්‍රමය (පුස්තකාලය ඉදිරිපිට)
15. පානගමුව පහල හන්දිය - පානගමුව පාසල් හන්දිය
16. පහළ ඕගොඩපොල හන්දිය
17. රන්තැටිකන්ද හන්දිය
18. නැලවුල්ල හන්දිය
19. ඉලුක්පිටිය හන්දිය
20. වෑගම හන්දිය
21. මිලියද්ද, ඉකිරිවත්ත හන්දිය
22. අක්කර 15 හන්දිය, පිහිඹුව
23. නියංගම හන්දිය, කණදෙනියාවල
24. කැප්පිටිගල හන්දිය, කණදෙනියාවල
25. දෙල්විට පොදු වෙළඳපල ඉදිරිපිට
26. උඩහොරොම්බුව පාලම අසළ
27. රැද්දගොඩ හන්දිය, පාලම අසළ
28. පානගමුව පාසල් හන්දිය
29. සියඹලාගහමුල හන්දිය, පානගමුව

**හේවාවිස්ස කෝරලය**

30. ගෝණදෙනිය අංහන්දිය
31. කරඳගොල්ල හන්දිය, අඹකොටේ
32. හුණුපොලගෙදර හන්දිය, අඹකොටේ
33. කඩිහාගම හන්දිය, අංහන්දිය
34. පුස්සැල්ල හන්දිය, පුස්සැල්ල
35. බුළුවල හන්දිය, බුළුවල
36. හාලිඇල්ල හන්දිය, තල්ගස්පිටිය
37. කුරුම්බාව හන්දිය, අඹකොටේ
38. තල්ගස්පිටිය හන්දිය, අඹකොටේ
39. ජාකඩුව පාලම අසල, පුස්සැල්ල, පුස්සැලිතැන්න

**කෝරලය**

40. මැල්සිරිපුර හන්දිය, දොඩම්ගස්ලන්ද නගරය
41. දොඩම්ගස්ලන්ද පොල ඉදිරිපිට, දොඩම්ගස්ලන්ද
42. ලිහිණිවැහැර, තෙළඹුගල්ල පන්සල් හන්දිය
43. කහටගහමුල හන්දිය, දොඩම්ගස්ලන්ද
44. රුක්අත්තනගහමුල, ලිහිණිවැහැර, දොඩම්ගස්ලන්ද
45. කැලෑමුල්ල හන්දිය, මදුරාගොඩ
46. පතල් හන්දිය, මදුරාගොඩ
47. කඳුපළාත හන්දිය, මදුරාගොඩ
48. මදුරාගොඩ 17 හන්දිය, මදුරාගොඩ
49. කටුපිලගොල්ල හන්දිය, දොඩම්ගස්ලන්ද

03-529

## විවිධ දැන්වීම්

### හපුතලේ නගර සභාව

නගර සභා ආඥාපනත (255 වැනි අධිකාරය)

(255 වැනි අධිකාරය) නගර සභා ආඥාපනතේ 164 වැනි උපවගන්තිය යටතේ 1979 අංක 42 දරන මහ නගර සභා හා නගර සභා (සංශෝධන) පනත යටතේ හපුතලේ නගර සභාව විසින් පහත බලපත්‍ර ගාස්තු 2014 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා ක්‍රියාත්මක වන පරිදි පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. කර්මාන්ත (වෙළඳ) ව්‍යාපාර දෙකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා එක් ස්ථානයක් යොදවා ගනු ලබන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවල සඳහන් එක් ව්‍යාපාරයක් එම ස්ථානයේ පවත්වාගෙන යන්නේයැයි සලකා, බලපත්‍ර ගාස්තු අයකරනු ලැබේ.

උපුල් දිසානායක,
සභාපති,
හපුතලේ නගර සභාව.

2014 ජනවාරි මස 30 දින,
හපුතලේ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***1979 අංක 42 දරන මහ නගර සභා, නගර සභා ආඥාපනතේ 14 වැනි වගන්තිවලින් දක්වා ඇති බලපත්‍ර ගාස්තු***

| | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි* |
|---|---|---|---|---|
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | අයිස්ක්‍රීම් විකිණීමේ/නිෂ්පාදනය කිරීමේ/ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 500 0 | 1,000 0 |
| 02. | අවමංගල්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීම/ගබඩා කිරීම/විකිණීම සඳහා සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 04. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | කරනවෑම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | අමුත්තන්ගේ නවාතැන්පළක් පවත්වාගෙන යාම (කාමර 01 සිට 04 දක්වා) | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 10. | අමුත්තන්ගේ නවාතැන්පළක් පවත්වාගෙන යාම (කාමර 04 ට වඩා වැඩිවන කාමරයක් සඳහා) | 500 0 | 500 0 | 500 0 |
| 11. | හෝටලයක් සමග නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | සංචාරක නිවාසයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | මස් කඩයක් පවත්වාගෙන යාම (ගවමස්/එළුමස්) (නගර සභා ටෙන්ඩර් කඩ කාමර සඳහා පමණි) | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | මාළු වෙළඳ සැලක් පවත්වාගෙන යාම (නගර සභා ටෙන්ඩර් කඩකාමර සඳහා පමණි) | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | සිසිල් බීම නිෂ්පාදනය කිරීම/ගබඩා කිරීම/අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ශීතකළ කුකුල් මස්/මාළු/අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | කුකුල් පොහොර/පොහොර/කාබනික පොහොර ගබඩා කිරීමේ/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 19. | කෘෂි රසායනික බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීමේ/විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 20. | රසායනික පොහොර ගබඩා කිරීම/විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 21. | රස කැවිලි නිෂ්පාදනය කිරීම/ගබඩා කිරීම/පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ජංගම රථයක් මගින් බේකරි කෑම අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 4ට වැඩි 10ට අඩු) | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | කුකුළන් 50ට වැඩි 100ට අඩු ගණනක කුකුල් ගොවිපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | පපඩම් නිෂ්පාදනය කිරීමේ/ගබඩා කිරීමේ/විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | නිමි ඇඳුම් විකිණීම සඳහා ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | බිම්මල් වගා කිරීම/පැකට් කිරීම/විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | යෝගට් නිෂ්පාදනය කිරීම/ගබඩා කිරීම/විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | බේකරි කෑම සහ සිසිල් බීම හෝ කිරි කෝපි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | කිරි හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ජංගම මාළු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | දේශීය රැකියා ඒජන්සිය | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | විදේශීය රැකියා ඒජන්සිය | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | කිරි ශීත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 2,500 0 | 3,000 0 |

***අංක 02 යටතේ අප්‍රසන්න හා අන්තරායදායක වෙළඳාමට අයත් නොවන ව්‍යාපාර***

| | | | | |
|---|---|---|---|---|
| 01. | ඇලුමිනියම් භාණ්ඩ/ප්ලාස්ටික් භාණ්ඩ ගබඩා කිරීමේ/විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | සිංහල ආයුර්වේද බෙහෙත් විකිණීමේ/ගබඩා කිරීමේ/නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | නැවත පිරවීම සඳහා ටයර් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් හා වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි රු. ශ. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශ. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි රු. ශ. |
|---|---|---|---|---|
| 05. | තොග හා සිල්ලරට විකිණීම සඳහා පොල්තෙල් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | සිංහල හෝ ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,250 0 | 1,500 0 |
| 08. | පරණ ලෝහ/හිස් ගෝනි/බෝතල්/පුවත්පත්/කඩදාසි/අබලන්වූ ද්‍රව්‍ය විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ඇස් කණ්නාඩි අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ජංගම දුරකථන උපාංග අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,000 0 | 1,000 0 |
| 11. | කොමිනිකේෂන් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | පාසල් පොත්/උපකරණ/පුවත්පත් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | රූපලාවන්‍ය අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | මැසූ ඇඳුම්/රෙදිපිළි අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 900 0 | 1,000 0 |
| 15. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 550 0 | 650 0 |
| 16. | සිල්ලර බඩු අලෙවි සලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | තොග හා සිල්ලර බඩු අලෙවි සලක් පවත්වාගෙන යාම | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 18. | සාප්පු බඩු අලෙවි සලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 20. | ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | වානේ ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 900 0 |
| 23. | සිල්ලරට එළවළු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | එළවළු තොග වශයෙන් මිලදී ගැනීම/ගබඩා කිරීම/අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | උත්සව භාණ්ඩ කුලියට දීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| 27. | ගුවන් විදුලි යන්ත්‍ර/රූපවාහිනී යන්ත්‍ර/ඩෙක්/ටේප් රෙකෝඩර් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | කුළු බඩු, ධාන්‍ය වර්ග ඇඹරුම්හලක් පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | යන්ත්‍රානුසාරයෙන් ගෘහභාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 31. | දර විකිණීම සඳහා ගබඩා කර තබා ගැනීම | 100 0 | 150 0 | 500 0 |
| 32. | කුෂන් කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 |
| 33. | රථ වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | වෑල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | පාපැදි, යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | කම්මලක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 |
| 37. | කළුගල් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | කළුගල් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | බ්ලොක් ගල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 750 0 |
| 40. | ගිනිකෙළි භාණ්ඩ/මල්වෙඩි/රතිඤ්ඤා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | දැව ගබඩාවක් පවත්වාගෙන යාම (ඉරාපු ලී) | 750 0 | 1,000 0 | 1,000 0 |
| 42. | ගෑස් සිලින්ඩර් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | වීදුරු/මල් පඳුරු ගබඩා කිරීමේ/අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 500 0 |
| 44. | ගබඩාවක් පවත්වාගෙන යාම (ආහාර) | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | ටින්කර් වැඩපළක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 |
| 46. | ගීත පටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | වීඩියෝ පීස්/සීඩී තැටි/කැසට් පට අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | පූජා භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | පළතුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 700 0 |
| 50. | දැව ඉරුම් මෝලක් පවත්වාගෙන යාම | 550 0 | 750 0 | 1,000 0 |
| 51. | බුලත්/පුවක්/දුම්කොළ/කන හුණු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 450 0 |
| 52. | සත්ත්ව ආහාර විකිණීමේ/ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි රු. ශ. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශ. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි රු. ශ. |
|---|---|---|---|---|
| 53. | පින්තාරු තීන්ත/පොලිෂ්/වාර්නිෂ්/ඩිස්ටැම්පර් තීන්ත ගබඩා කිරීමේ/අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 750 0 | 900 0 | 1,000 0 |
| 55. | සිල්ලරට කරවල අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම | 3,000 0 | 3,000 0 | 3,000 0 |
| 57. | පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 58. | පාවහන් අලෙවි කිරීමේ/නිෂ්පාදනය කිරීමේ, ගබඩා කිරීමේ/ අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | පුවත්පත්, සඟරා අලෙවි කරන සාප්පුවක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 60. | විකිණීම සඳහා පොල් 200ට වඩා ගබඩා කිරීම | 250 0 | 550 0 | 750 0 |
| 61. | සම් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | පිඟන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | සුරතල් මසුන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 64. | සුරතල් මසුන් ඇති කිරීම සඳහා වීදුරු ටැංකි සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 |
| 65. | පෞද්ගලික ළදරු පාසලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | බැටරි කෝෂ චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | රථ වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,200 0 | 1,500 0 |
| 68. | පාවිච්චි කරන ලද රථ වාහන අමතර කොටස් (පරණ) අලෙවි කිරීම සඳහා ගබඩා කර තබා ගැනීම | 1,000 0 | 1,000 0 | 1,000 0 |
| 69. | පාපැදි/යතුරු පැදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 4,000 0 |
| 70. | රථ වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | පරිගණක භාවිතා කර ඡායාරූප/ලිපි සකස් කිරීමේ හා ලැමිනේට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | රියැදුරු පාසලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | ගිණුම් කටයුතු සඳහා කාර්යාලයක් පවත්වාගෙන යාම (පෞද්ගලික) | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | රබර් මුද්‍රා/නිල මුද්‍රා/නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 |
| 75. | රේස් ඔට්ටු කාර්යාලයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 900 0 |
| 76. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | විසිතුරු භාණ්ඩ/විදුලි උපකරණ විකිණීම සඳහා ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | ශබ්දවාහිනී යන්ත්‍ර/ජෙනරේටර්/කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | වේවැල් භාණ්ඩ/පන්පැදුරු/කෘත්‍රිම කෙඳි පැදුරු/පාපිසි/කාපට් විකිණීම සහ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | වීඩියෝ කැමරා කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | ගුවන් විදුලි යන්ත්‍ර/රූපවාහිනී යන්ත්‍ර/පරිගණක යන්ත්‍ර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | ස්වර්ණාභරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,000 0 | 1,000 0 |
| 83. | මැණික් මිළදී ගැනීමේ/ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,000 0 | 1,000 0 |
| 84. | ගොඩනැගිලි සඳහා බ්ලොක්ගල්/බීරළු/ආලෝක කවුලු/නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| 85. | ශීතකරණ භාවිතාකර යෝගට්/අයිස්ක්‍රීම්/අයිස් පැකට්/අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 500 0 |
| 86. | උත්සව හෝ නවාතැන් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 87. | අලුහුණු ගබඩා කර විකිණීම | 300 0 | 750 0 | 1,000 0 |
| 88. | හිස් ගෝනි/බෝතල්/පරණ පුවත්පත්/කඩදාසි ගබඩා කර තබා ගැනීම | 500 0 | 700 0 | 900 0 |
| 89. | සුවඳ විලවුන් නිෂ්පාදනය කිරීමේ/විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 500 0 | 700 0 |
| 90. | මැටි භාණ්ඩ/සිමෙන්ති භාණ්ඩ නිපදවීම/විකිණීම/ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 91. | මනිබඩු/තෑගි භාණ්ඩ අලෙවි කිරීම සඳහා ගබඩා කර තබා ගැනීම | 200 0 | 500 0 | 750 0 |
| 92. | ලොතරැයි අලෙවි කුටියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 93. | පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 94. | පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 95. | අත් බෑග්/පාසල් බෑග්/ගමන් මලු විකිණීම සඳහා ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |

| | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි* |
|---|---|---|---|---|
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 96. | කැබලි රෙදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 97. | දුරකථන කුටියක් හෝ ඊට වැඩි ගණනක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 98. | ලොරි බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 99. | යකඩ ග්‍රිල්/ගේට්ටු/පුටු/වාහනේ උපකරණ නිපදවීමේ/අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 100. | රථ වාහන ටින්කර්/ස්ප්‍රේ පේන්ටින් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 101. | ශීතකරණ අධි ශීතකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 102. | තේ කුඩු පැකට් කිරීමේ/විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 103. | මල් පැළ හෝ වෙනත් පැළ වර්ග විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 |
| 104. | පරිගණක අමතර කොටස්/රූපවාහිනී අමතර කොටස්/ඩෙක්/ටේප් රෙකෝඩර් අමතර කොටස් අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 105. | පෞද්ගලික සංගීත පංති පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 106. | රස කැවිලි වර්ග/කඩල/මුරුක්කු/පකඩ පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 107. | ජංගම කරත්ත මගින් වඩේ/පැටිස්/කඩල/සම්සා වැනි ආහාර වර්ග විකිණීම | 300 0 | 500 0 | 750 0 |
| 108. | දේශීය මත්පැන් වර්ග අලෙවිසලක් පවත්වාගෙන යාම | 3,000 0 | 3,000 0 | 3,000 0 |
| 109. | විදේශීය මත්පැන් වර්ග අලෙවිසැලක් පවත්වාගෙන යාම | 3,000 0 | 3,000 0 | 3,000 0 |
| 110. | සෝයාවලින් නිෂ්පාදිත ආහාර අලෙවිසැලක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 111. | නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 112. | ජ්‍යොතිෂ කාර්යාලයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 113. | වෙළඳ දැන්වීම් සහ වෙළඳ ප්‍රචාරක ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 114. | උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 115. | විදුලියෙන් ලෝහ ආලේපනය කිරීම | 250 0 | 350 0 | 500 0 |
| 116. | ආයුර්වේද සම්බාහන මධස්ථානයක් පවත්වාගෙන යාම | 4,000 0 | 5,000 0 | 6,000 0 |
| 117. | සංනිවේදන කුළුණු | 5,000 0 | 7,500 0 | 10,000 0 |

**කර්මාන්ත (වෙළඳ ව්‍යාපාර) විෂයයන්හි වාර්ෂික බදු අය කිරීම**

***ඉහත අංක 1 සහ 2 දරන බලපත්‍ර ලේඛනයට ඇතුලත් වී ඇති කර්මාන්ත***

*බද්දට යටත්වන ව්‍යාපාර*

01. කර්මාන්ත
02. වෘත්තීය හා ජීවනෝපාය
03. කොමිස් නියෝජිතයන්
04. නිෂ්පාදකයන්
05. වෙන්දේසිකරුවන්
06. තැරැව්කරුවන්
07. අධ්‍යාපන ආයතන
08. පෞද්ගලික බැංකු

රජයෙන් ආධාර ලබන අධ්‍යාපනික ආයතන මෙම බද්දෙන් නිදහස් වේ.

| | *වර්ෂය සඳහා ව්‍යාපාරයෙන් ලැබීම්* | *බලපත්‍ර ගාස්තු රු. ශත* |
|---|---|---|
| 01. | රු. 6,000 නොඉක්මවන විට | 90 0 |
| 02. | රු. 6,000 ට වැඩි එහෙත් රු. 12,000 ට නොඅඩු | 130 0 |
| 03. | රු. 12,000 ට වැඩි එහෙත් රු. 18,750 ට වැඩි නොවූවිට | 1,100 0 |
| 04. | රු. 18,750 ට වැඩි එහෙත් රු. 75,000 ට නොවැඩි | 1,800 0 |
| 05. | රු. 75,000 ට වැඩි එහෙත් රු. 1,50,000 ට නොවැඩි | 2,000 0 |
| 06. | රු. 1,50,000 ට වැඩි වූ විට | 4,000 0 |

03-378/1

## හපුතලේ නගර සභාව

නගර සභා ආඥාපනත (255 වැනි අධිකාරය)

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 වැනි හා 157 වැනි වගන්තිය යටතේ හපුතලේ නගර සභාව විසින් සම්පාදිතව එම ආඥාපනතේ 154 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව 1967 සැප්තැම්බර් මස 01 වැනි දින අංක 1464 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන්නට යෙදුණු 1967 හපුතලේ නගරය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා කාණ්ඩයේ 3(3) (1) දරන ඡේදයේ සඳහන් කරන්නට යෙදෙන 2009.01.02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය* IV (ආ) කොටසින් සඳහන් කර ඇති උපලේඛනය 2014 වර්ෂයේ සිට ද ඒ අයුරෙන්ම බල පැවැත්වෙන පරිදි අයකිරීමට හපුතලේ නගර සභාව තීරණය කරන්නට යෙදුන බව සියලු දෙනාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කර සිටිමි.

උපුල් දිසානායක,
සභාපති,
හපුතලේ නගර සභාව.

හපුතලේ නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

01. මාස 03 කට අඩු කාලයක් සඳහා වූ වෙළඳ දැන්වීම් හෝ ප්‍රචාරක දැන්වීම් සඳහා වූ බැනරයක් වෙනුවෙන් අවම ගාස්තුව රු. 200 ක් වන අතර, වර්ග අඩි 30 කට වැඩිවන විට සෑම වර්ග අඩියක් වෙනුවෙන් රු. 10 ක අතිරේක ගාස්තුවක් ද,
02. මාස 03කට වැඩි මාස 06ක් දක්වා වූ කාලයක් සඳහා රු. 300 ක් වන අතර, වර්ග අඩි 20 ඉක්මවන විට සෑම වර්ග අඩියක් සඳහාම රු. 20ක අතිරේක ගාස්තුවක් ද,
03. මාස 07 සිට 12 දක්වා වූ කාලයක් සඳහා වූ විට අවමය රු. 400ක් විය යුතු අතර, වර්ග අඩි 20ක් ඉක්මවන විට සෑම වර්ග අඩියක් සඳහාම රු. 30ක අතිරේක ගාස්තුවක් ද අයකිරීමට තීරණය කරනු ලබන අතර,
04. මුළු වර්ෂය තුළ සවිකර ප්‍රචාරක කටයුතු කරනු ලබන ස්ථිර ආලෝකන දැන්වීම් පුවරුවක් සඳහා එක් වර්ග අඩියකට රු. 150ක ගාස්තුවක් ද,
05. මුළු වර්ෂය තුළ සවිකරන ප්‍රචාරක කටයුතු කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා 01 වර්ග අඩියකට රු. 100ක ගාස්තුවක් ද අයකිරීමට තීරණය කරනු ලැබූ බවත්ය.

03-378/2

---

## නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2014 වර්ෂයට අදාලව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයෙහි සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද නොච්චියාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක 178(viii)-2013 යටතේ පහත සම්මත කරන ලද යෝජනාව 2014 වර්ෂයෙහි ජනවාරි මස 17 වැනි දින පවත්වන ලද නොච්චියාගම ප්‍රාදේශීය සභා විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 04-2014 යටතේ සංශෝධනය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. නලින් දිසානායක,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2014 ජනවාරි මස 17 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 වගන්තිය අනුව නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර නොච්චියාගම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, මාවතකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2014 වර්ෂයට පනවා අයකල යුතු බවත් නොච්චියාගම ප්‍රාදේශීය සභාව තීරණය කරන්නිය. ".

### උපලේඛනය

| | | රු. ශත |
|---|---|---|
| 01. | බිත්ති, තාප්ප හෝ පුවරුවක් උපයෝගී කරගන්නා ඕනෑම ප්‍රචාරන දැන්වීමක් සඳහා වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා) | 100 0 |
| 02. | *ස්ථිර දැන්වීම් පුවරු ගාස්තු :* | |
| (i) | විනිවිද පෙනෙන දැන්වීම් පුවරුවකට වර්ග අඩියකට | 75 0 |
| (ii) | විදුලි ආලෝකය කරන ලද දැන්වීම් පුවරුවකට වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා) | 75 0 |
| 03. | ඉටිරෙදි හෝ රෙදි මගින් දැන්වීම් පුවරු ගාස්තු | |
| (i) | විනිවිද පෙනෙන දැන්වීම් පුවරුවකට වර්ග අඩියකට | 25 0 |
| (ii) | විදුලි ආලෝකය කරන ලද දැන්වීම් පුවරුවකට වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා) | 15 0 |

03-493

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.